# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2351/31 - 2023 සැප්තැම්බර් මස 27 වැනි බදාදා - 2023.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175) වැනි අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය,
2023 .................................. වැනි දින,
කොළඹ දී ය.

1. මේ නියෝග බමුණුකොටුව ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාලයේ (වාර්ෂික උත්සවය) පෙරහැර නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල ඃ-
කඳවුරු පෙදෙස යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශය අදහස් වේ.
දිසාපතිවරයා යන්නෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා අදහස් වන අතර ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.
'වෛද්‍ය නිලධරයා' යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.
'වන්දනාකරු' යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත්වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතරවී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.
'පොලිස් නිලධරයා' යන්නට කඳවුරු පෙදෙස භාර යම් ග්‍රාමසේවා නිලධරයෙක් ද ඇතුළත්වේ. තවද,
'මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා' යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. මේ නියෝග කුරුණෑගල පරිපාලන දිස්ත්‍රික්කයේ ගොන්නව ශ්‍රී විෂ්ණු දේවස්ථානයේ පෙරහැර උත්සවය සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේය.

4. එම පෙරහැර මංගල්‍යය කාලය තුළ සියලුම වන්දනා කරුවන් වන්දනා ගමන් ආඥාපනත නියෝගවලට යටත්ව කටයුතු කළ යුතු බැව් මෙයින් නියෝග කරමි.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට බලය ඇත්තේය.


1A - G 40414 — 9 (2023/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ තමාවෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයෙකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතුය.

6. දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයෙකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුරු පෙදෙස තුළට ගෙනඒම නොකළ යුතුය. එසේ වුවද 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් මේ නියෝග අදාළ නොවන්නේය.

7. (1) කඳවුරු පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන්කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට බලය ඇත්තේය.

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවත්වා තබන ස්ථාන
(ආ) කරත්ත හා ගොනුන් නවත්වා තබන ස්ථාන
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙන ම ස්ථාන
(ඈ) අසනීප වන වන්දනාකරුවන්ට නතර වීම පිණිස ස්ථාන
(ඉ) සිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම පිණිස ස්ථාන
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කර තබනු ලබන ස්ථාන
(උ) විවිධ කාර්යය සඳහා මඩු ඉදිකිරීමට හැකි ස්ථාන
(ඌ) සේදීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(එ) ස්නානය කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(ඒ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් සහ එවැනි පහසුකම් සලසන වෙනත් ස්ථාන
(ඔ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා සලකනු වෙනත් කාර්යයක් සඳහා වූ ස්ථාන

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ දැක්වෙන යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක්, ඒ ස්ථානයේ දැන්වීමක් හෝ නාම පුවරුවක් හෝ ප්‍රදර්ශනය කිරීමෙන් වෙන් කරනු ලැබිය හැකිය.

(3) දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක්ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතුය.

8. රෝග වළක්වා ගැනීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ළිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ළිඳක්, දිය වළක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයා හෝ අදහස් කළහොත් එසේ කිරීමට ඒ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට බලය ඇත්තේය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක කවර හෝ කාර්යයක් සඳහා යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තැනීමක් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදිකිරීමකට අතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ගොඩනැගිල්ලක් හෝ වෙනත් යම් ඉදිකිරීමක් තනනු ලැබුවහොත් හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් කොටසක් ඉදිකරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථානෝචිත පරිදි එම මඩුව හෝ ගොඩනැගිල්ල හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් එකතු කරන ලද කොටස ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තෙකු විසින් එහි සඳහන් කාලසීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ ඒ දැන්වීම භාරදෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක්ද යන්න පිළිබඳව සැකයක් උද්ගතවන අවස්ථාවක අවස්ථානෝචිත පරිදි ඒ මඩුව ගොඩනැගිල්ල

ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදිකිරීමකට අළුතින් එකතු කරන ලද කොටස ඉවත් කිරීමට හෝ කඩා දැමීමට දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම නීත්‍යානුකූල වන අතර, එකී ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා යම් ඉඩමකට හෝ භූමියකට ඇතුළුවීම ද ඒ ඉවත් කිරීම සඳහා අවශ්‍ය වන සියළු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නිත්‍යානුකූල වන්නේ ය.

10. යම් වැසිකිළියක හෝ වැසිකිළියක් අසල හෝ දැන්වීමක් හෝ සංඥා පුවරුවක් ප්‍රදර්ශනය කිරීමෙන් දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිරයා විසින් වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද වැසිකිළියක හැර කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ මළ මුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතුය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වලක, ජලාශයක, ඇලක, දොලක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතුය.

12. කැලි කසල දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ කැළිකසල දැමීම නොකරනු ලැබිය යුතුය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට සිය ආහාරපාන බෙදා හැරීම විධිමත් කිරීමේ බලය දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වෙනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙන ලද උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තෙකු අකීකරු නොවිය යුතුය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරීවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකිය.

(2) මේ නියෝගයේ (1) ඡේදය යටතේ පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම නොකරනු ලැබිය යුතුය.

(3) මේ නියෝගයේ (1) ඡේදය යටතේ පාවිච්චියට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු විසින් යම් තහනමකට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වන නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක් ද ඇතුළුව කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක එවැනි බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වා ගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියළුම බේකරි, කැවිලි හල්, කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියළු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාව හිතකර තත්ත්වයකින් තබාගත යුතුය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ වෙනත් කාර්යයක් සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියළුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුළුවිය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණ තුළ තැබීම කරනු ලැබිය යුතුය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාර හෝ පානයක ඉතුරු වූ කොටස් පිසීමේ දී ඉවතලන අපද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසි නොකරනු ලැබිය යුතුය. එවැනි සියළු ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය අපද්‍රව්‍ය 19 වන නියෝගයෙහි විධිවිධාන සකසා ඇති ආකාරයට තබා ඇති භාජනයට දැමිය යුතුය. එසේම අපද්‍රව්‍ය, ඉතිරි වූ කිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසල පොළවේ විසි කොට තිබෙන බවට පෙනී ගියහොත් ඒ ස්ථානයේ අයිතිකරු විසින් හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, කැවිලිහලක්, කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදුවීම

වැළැක්වීමට අවශ්‍ය සියළුම පූර්වෝපාය යෙදූ බවට නිසි සැලකිල්ලෙන් ක්‍රියාකළ යුතු බව ඔප්පු කරනු ලැබුවහොත් හැර එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලබන්නේය.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සිය බේකරිය, කැවිලිහල් සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝණ මීටර 1 1/2 කට (ඝණ අඩි 4 1/2 කට) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය හෝ ලෝහමය කසල බඳුනක් සපයනු ලැබිය යුතු අතර කසල බඳුන් එහි කසල තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසල ඉවත් කරනු ලබන විට හැර වෙනත් සෑම අවස්ථාවකදී ම දැවමය හෝ ලෝහමය පියනකින් වසා තැබිය යුතුය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාගේ මතය අනුව මේ නියෝගවල 15 වැනි, 16 වැනි, 17 වැනි, 18 වැනි හෝ 15 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටවනු ලැබූ ඇත්තා වූ හෝ පවත්වා ගෙන යනු ලබන්නාවූ ද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ සහ ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම් එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිසාපතිවරයාට ඇත්තේය.

(2) යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් භාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල නියමයන් අනුව ක්‍රියාකළ යුතුය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළ් නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් වන්දනාකරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේදී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය සහ පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු ක්‍රියා නොකල යුතුය.

(3) කඳවුරු පෙදෙස තුළ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇත්නම් සෑම තැනැත්තෙක්ම ද, යම් තැනැත්තෙකුට ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දූන දූනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටකත්, සෑම තැනැත්තෙක්ම ද ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතුය.

(4) ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක්, තත් කාලයෙහි භාරව සිටින යම් තැනැත්තෙකු විසින් දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගී වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතුය.

25. යම් බේකරියක්, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පොලක හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථානෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලි හලේ හෝ කැවිලි සාදන ස්ථානයේ, භෝජනාගාරයේ හෝ දන්සැලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාල සීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු හෝ සිටින බවට අනාවරණය වූ අවස්ථාවක අවස්ථානෝචිත පරිදි එහි බලපත්‍රධාරියෙකු විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට හෝ වාර්තා කළ යුතුය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම සහ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයකදී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතුය.

27. දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිණිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතුය.

28. 7 වැනි නියෝගය 10 වැනි නියෝගය හෝ යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය.

29. දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා, වෛද්‍ය නිලධාරියා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ යම් පොලිස් නිලධාරියෙකු විසින් :-

(අ) මේ නියෝග අතුරින් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

30. දිසාපතිවරයා විසින් :-

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්
(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්
(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් ඕනෑම වේලාවක එය එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

## උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1236 ග්‍රාම නිලධාරි වසමේ ගොන්නව ශ්‍රී විෂ්ණු දේවාලය පිහිටි භූමි භාගය

ඊට මායිම් පහත පරිදි දැක්වේ:–

*උතුරට* : ඩී. එම්. පුංචිබණ්ඩා මහතාට අයත් ඉඩම ;
*නැගෙනහිරට* : ඒ. ජී. අමරසිංහ මහතාට සහ පවුලේ අයට අයිති ඉඩම සහ සූරියගොඩ ගම් මායිම් ;
*දකුණට* : සූරියගොඩ ගම් මායිම් ;
*බස්නාහිරට* : ආර්. එම්. ප්‍රේමතිලක මහතාට අයිති ඉඩම සහ තවත් අයට අයිති ඉඩම ද.

පෙරහැර ගමන් ගන්නා මාර්ගය :–

දේවාලයේ සිට වාරියපොල - කළුගමුව මහා මාර්ගයට ඇති ප්‍රවේශ මාර්ගයේ මීටර් 100ක් පැමිණ එතැන් සිට කළුගමුව දෙසට බමුණාකොටුව මංසන්ධියට කි. මී. 2.5ක් ද බමුණාකොටුව මංසන්ධියෙන් මහකෙළිය කටුපොත දෙසට සියඹලන්ගමුව මංසන්ධිය (පිංතාලිය හන්දිය දක්වා) කි. මී. 4ක් පමණ ද එතැන් සිට ගන්තිරියාව ග්‍රාමයට යන ප්‍රාදේශීය සභා මාර්ගයේ කි. මී. 1.5ක් පමණ ගමන් කර වමට හැරී අතුරු මාර්ගයෙන් මීටර් 500ක් පමණ දුරින් තල්ගහගම ග්‍රාම නිලධාරී වසමේ හමන්ගල්ල ගමේ කොළමුණු ඔය දියකැපුම් තොටුපොල ලෙස භාවිතා කරයි.

EOG 09-0245

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.